## රජයේ සුරැකුම්පත්

රජයේ සුරැකුම්පත් යනු ශ්‍රී ලංකා රජය වෙනුවෙන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරනු ලබන අවදානම් රහිත ණය උපකරණයකි.

## ආයෝජන සඳහා පවතින සුරැකුම්පත්

භාණ්ඩාගාර බිල්පත්:

ආයෝජන අවශ්‍යතාවය කෙටි කාලීන නම්

- ඔබට දින 91, දින 182, සහ දින 364 කාල සීමාවන් සඳහා භාණ්ඩාගාර බිල්පත් ලබා ගත හැකිය.
- මෙම බිල්පත් වට්ටම් මිලකට නිකුත් කෙරේ.
- කල් පිරීමේදී පොලී ඇතුළු මුළු මුදල ගෙවනු ලැබේ.

භාණ්ඩාගාර බැඳුම්කර:

ආයෝජන අවශ්‍යතාවය දිගු කාලීන නම්

- ඔබට අවුරුදු 2 - 20 කාල සීමාවන් සඳහා මැදි හා දිගු කාලීන භාණ්ඩාගාර බැඳුම්කර මිලදී ගත හැකිය.
- බැඳුම්කර සඳහා මාස 6 කට වරක් පොලී ගෙවනු ලැබේ.
- වෙළෙඳපොල තත්ත්වය අනුව වට්ටම් මිලකට, සම මිලට හෝ අධි වට්ටම් මිලකට නිකුත් කරනු ලැබේ.
- කල් පිරීමේදී මුහුණත වටිනාකම ගෙවනු ලැබේ.

## රජයේ සුරැකුම්පත් වල ආයෝජනය කිරීමෙන් ලැබෙන වාසි මොනවාද?

- අවදානම් රහිත ආයෝජනයක් වීම
- ඉහළ ප්‍රතිලාභයක් ලැබීම
- ගනුදෙනු කළහැකි සහ පැවරිය හැකි ආයෝජන උපකරණයක් වීම
- කල් පිරීමට පෙරාතුව හෝ ඕනෑම විටකදී පහසුවෙන් මුදල් බවට පරිවර්තනය කළහැකි වීම
- පොලී ආදායම සහ කල්පිරුණු විට මුළු මුදලම ඔබ ආයෝජනය කළ මුදල්වලින්ම ආපසු ඔබට ගෙන යා හැකිවීම
- ඔබට වෙනත් අයෙකු හෝ කිහිපදෙනෙකු සමග බද්ධ ආයෝජනයක් සිදුකළ හැකිවීම
- මෙම ආයෝජන වලින් ලැබෙන පොලී ආදායම, පුද්ගලයන් සඳහා ආදායම් බද්දෙන් නිදහස්වීම
- මුද්දර බද්දෙන් නිදහස් වීම
- ආයෝජනයේ අයිතිය ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පවත්වා ගෙන යන මධ්‍යම තැන්පතු පද්ධතිය තුල පරිගණක ගතකර ලියාපදිංචි කිරීම නිසා ඔබේ අයිතිය තහවුරු කළහැකි වීම
- මධ්‍යම තැන්පතු පද්ධතිය මගින් ගනුදෙනු, නොපියවා පවතින ශේෂය සහ කල් පිරීම හා පොලී ගෙවීම පිළිබඳ තොරතුරු සනාථ කෙරෙන වාර්තා ලබාදීම
- පොලී සහ පරිණතවීමේ දී ලැබිය යුතු මුළු මුදල් එදිනම ආයෝජකයන්ගේ ගිණුමට බැර කිරීමට කටයුතු සැලසීම
- ආයෝජකයන්ට තම ආයෝජන පිළිබඳ තොරතුරු අවශ්‍ය ඕනෑම විටෙක අන්තර් ජාලය හරහා ලබා ගැනීමේ පහසුව සැලසීම
- මධ්‍යම තැන්පතු ක්‍රමය ආයෝජකයන් හට පහත සඳහන් ප්‍රකාශන නිකුත් කරනු ඇත.
  - (අ) මාසය තුල සිදු කරන ලද ගනුදෙනු සනාථ කරමින් මාසික ප්‍රකාශනයක්
  - (ආ) එක් එක් ආයෝජකයා සතු නොගෙවූ ශේෂයන් දක්වමින් අර්ධ වාර්ෂික ප්‍රකාශනයක්
  - (ඇ) කල් පිරුණු ගෙවීම් හා පොලී ගෙවීම් සිදුවන අවස්ථාවලදී ඒ පිළිබඳ විස්තර දක්වන ප්‍රකාශනයක්

## යෝග්‍යතාව (සුදුසුකම් ලත් ආයෝජකයින්)

පහත සඳහන් පුද්ගල කාණ්ඩයන් රාජ්‍ය සුරැකුම්පත් වල ආයෝජනය සඳහා සුදුසුකම් ලබයි.

(අ) විදේශ රටවල ස්ථිරව පදිංචිවී සිටින ශ්‍රී ලාංකිකයින්

(ආ) ශ්‍රී ලංකාවේ හා තවත් රටක ද්විත්ව පුරවැසිභාවය හිමි ශ්‍රී ලාංකිකයින්

(ඇ) විදේශීය මුදල් වලින් ආදායමක් ලබන, ශ්‍රී ලංකාවේ හෝ විදේශයක ජීවත් වන ශ්‍රී ලාංකික වෘත්තිකයින්

(ඉ) විදේශීය රටක රැකියාවක හෝ ව්‍යාපාරයක යෙදෙන ශ්‍රී ලාංකික පුරවැසියන්

(ඊ) ඉහත කාණ්ඩ වෙනුවෙන් භාරකාරත්වය දරන බැංකු

## සිදු කල හැකි ගනුදෙනු

- සුදුසුකම් ලත් ආයෝජකයින් හට ශ්‍රී ලංකා රජය විසින් නිකුත් කරනු ලබන භාණ්ඩාගාර බිල්පත්/භාණ්ඩාගාර බැඳුම්කර ප්‍රධාන කළමනාකරුවන් හරහා මිලදී ගත හැකිය.
- සුදුසුකම් ලත් ආයෝජකයින් හට ප්‍රතිමිලදී ගැනුම් හා ප්‍රති විකුණුම් සිදු කළ හැක්කේ මෙම ක්‍රමය යටතේම නිකුත් කරන ලද භාණ්ඩාගාර බිල්පත්/බැඳුම්කර සහිත සුදුසුකම් ලත් ආයෝජකයින් සමග පමණි.
- සුදුසුකම් ලත් ආයෝජකයින් හට ඕනෑම අවස්ථාවක ද්විතීයික වෙළෙඳපොල තුල මෙම සුරැකුම්පත් විකිණීම හෝ හුවමාරු කිරීම සිදු කළ හැකිය.

## පොලී හා කල් පිරුණු ගෙවීම් සිදු කරන ආකාරය

රජයේ සුරැකුම්පත් හා සම්බන්ධ පොලී හා කල් පිරුණු ගෙවීම් නියමිත දිනයන්හිදී දේශීය බැංකු හරහා ඔබගේ ගිණුම් වෙත සෘජුවම බැර කරනු ලැබේ.

## ආයෝජනය කරන ආකාරය

විදේශීය රටවල ජීවත් වන ශ්‍රී ලාංකිකයන්ට රජයේ සුරැකුම්පත් අලෙවි කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව මගින් පත් කරන ලද ප්‍රධාන කළමනාකරුවන් හරහා ඕනෑම අවස්ථාවකදී භාණ්ඩාගාර බිල්පත්/භාණ්ඩාගාර බැඳුම්කර මිලදී ගත හැකිය. එම ආයතන හා ඒ සම්බන්ධ තොරතුරු පහත දක්වා ඇත.

භාණ්ඩාගාර බිල්පත්/බැඳුම්කරවල මුදල් හුවමාරු සිදු කිරීම සඳහා භාණ්ඩාගාර බිල්පත්/බැඳුම්කර ආයෝජන බාහිර රුපියල් ගිණුම - දේශාභිමානී (TIERA-D) නමින් හඳුන්වන රුපියල් වලින් පවත්නා ගිණුමක් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි ඔබ වෙනුවෙන් වාණිජ බැංකුවක ආරම්භ කිරීමට ඔබ තෝරාගත් ප්‍රධාන කළමනාකරුට දැනුම් දිය හැකිය.

ගනුදෙනුව සිදු කිරීමෙන් පසු, ඔබගේ නියෝජිත (ප්‍රධාන කළමනාකරු) විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ මධ්‍යම තැන්පතු ක්‍රමය තුල ඔබ වෙනුවෙන් සුරැකුම්පත් ගිණුමක් ආරම්භ කරනු ඇත. මෙම ගිණුම ඔබගේ ගනුදෙනු මත පදනම්ව එසැනින්ම හර/බැර වනු ඇත.

## අන්තර්ජාලය හරහා ගිණුමේ තොරතුරු පරීක්ෂා කිරීමේ පහසුකම

ආයෝජනය සිදු කිරීමෙන් පසුව අන්තර්ජාලය හරහා ඔබගේ ගිණුමේ තොරතුරු පරීක්ෂා කිරීම සඳහා රහස්‍ය අංකයක් ඉල්ලුම් කළ හැකිය. (https://www.cbsl.lk/lankasec/)

එම අයදුම් කිරීම ඔබගේ ප්‍රධාන කළමනාකරු හරහා සිදු කළහැකිය.

## ප්‍රධාන කළමනාකරුවෝ

ලංකා බැංකුව — දුරකථන: +94-11-2471605
ඊමේල්: cmt@boc.lk

කොමර්ෂල් බැංකුව — දුරකථන: + 94-11-2432116
Email: Dula_Weerathunga@combank.net

ජාතික ඉතිරිකිරීමේ බැංකුව — දුරකථන: +94-11-2467431
ඊමේල්: ceo.nsbfmc@nsb.lk

නැට්වෙල්ත් සෙකියුරිටීස් ලිමිටඩ් — දුරකථන: +94-11-4716274
ඊමේල්: chandrad@natwealth.com

මහජන බැංකුව — දුරකථන: +94-11-2308782
ඊමේල්: kumarnv@peoplesbank.lk

සම්පත් බැංකුව — දුරකථන: + 94-11-2300145
ඊමේල්: dambawinne@sampath.lk

විදේශයන්හි නියෝජිත බැංකු සහ ආයතන පිළිබඳ තොරතුරු ඉහත ප්‍රධාන කළමනාකරුවන්ගෙන් ලබා ගත හැකිය.

### වැඩි විස්තර

- පවත්නා රාජ්‍ය සුරැකුම්පත් හා වෙළෙඳපොල තත්ත්වය පිළිබඳව තොරතුරු ප්‍රධාන කළමනාකරුවන්ගෙන් හා ශ්‍රී ලංකා මහ බැංකු වෙබ් අඩවිය තුලින් ලබාගත හැකිය. (www.cbsl.gov.lk)
- මෙම වැඩසටහන පිළිබඳ ඕනෑම තොරතුරක් සඳහා විමසන්න.

රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව
නො: 30, ජනාධිපති මාවත
කොළඹ 01.

සෘජු දුරකථනය : +94-11-2477777
ජගත් : +94-11-2477316
රුවිනි : +94-11-2477076
ශානිකා : +94-11-2477291
ෆැක්ස් : +94-11-2477718/719/759
ඊමේල් : pdebt@cbsl.lk
වෙබ් අඩවිය : www.cbsl.gov.lk

Printed at the Central Bank Press - 09029

# විදේශීය රටවල පදිංචි හා විදේශීය රටවල රැකියාවල නියුතු ශ්‍රී ලාංකිකයන් හට ඇරයුමක්

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික
සමාජවාදී ජනරජය

වඩාත් සුරක්ෂිතව හා ඉහළ පොලී
අනුපාතික සහිතව ශ්‍රී ලංකාව තුල මුදල්
ආයෝජනය කරමින්
ජාතියේ සංවර්ධනයට උරදීමට

## ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත්
## භාණ්ඩාගාර බිල්පත්
## භාණ්ඩාගාර බැඳුම්කර

ශ්‍රී ලංකා මහ බැංකුව
www.cbsl.gov.lk